සැ.යු .- (i) 2015.09.04 දින පළවූ අංක 1931 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2015 වර්ෂය සඳහා කුරුණෑගල සහ කුලියාපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,932 - 2015 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2015.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 600 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 601 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 604 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 සැප්තැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

599 – B 080982 —352 (2015/09)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 348

MOD/DEF/2/01/ENL/07/DOCT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම්

පහත නම සඳහන් මහත්මා 2014.07.01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල සේනාවේ ලුතිනන් කර්නල් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුද වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

දීපාල් සංජය හෙයියන්තුඩුව.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

09-225

---

2015 අංක 349

MOD/DEF/2/01/ENL/03/ORC.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම

පහත නම සඳහන් බලලත් නිලධාරි 2014 සැප්තැම්බර් මස 26 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදාවේ ලුතිනන් (උපකරණ පාලක) කාර්මික නිලධාරියෙකු වශයෙන් අධිකාරියට පත් කිරීම සහ එම දින සිට නම ඉදිරියෙන් දක්වා ඇති බලකාය වෙත ඇතුළත් කිරීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සෙ/601218 බලලත් නිලධාරි 1 එම්ජ්එස් ප්‍රියශාන්ත ශ්‍රීලයුයුබ ට පසු ආසන්නතම ජ්‍යෙෂ්ඨතාවයේ තබා ලුතිනන් (උපකරණ පාලක) කාර්මික නිලයෙන් අධිකාරියට පත් කිරීම

සෙ/700731 බලලත් නිලධාරි 1 එදිරිසිංහ ආරච්චිලාගේ දර්ශන සමීර එදිරිසිංහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

09-137

---

2015 අංක 350

DIRF/RECT/252/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2014.11.30 දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බලසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදිනම සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බලකා වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/57144 කෙනි හිගුරලගේ ගයාන් රොසන්ත සඳරුවන් ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදව

සී/57381 කෙනි දිසානායක මුදියන්සේලාගේ තුෂාර මදුරංග දිසානායක ශ්‍රී ලංකා සංඥා බලකාය

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

09-136

---

2015 අංක 351

MOD/DEF/2/01/ENL/09/UNI.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම්

පහත සඳහන් කෙඩෙඩ් නිලධාරි 2014 දෙසැම්බර් මස 05 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/58565 කෙඩෙට් නිලධාරි - රත්කලස්ගේ මංජුල ප්‍රභාත් අබේසිංහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

09-138

2015 අංක 352

MOD/DEF/2/01/ENL/13/NDT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරී 2015 මාර්තු මස 19 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුළත් කිරීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/58621 කෙඩෙට් නිලධාරි විලියම් අබේනන්දගේ දුලංක සම්පත් අබේනන්ද

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

09-224

# රජයේ නිවේදන

### සබරගමුව මහ සමන් දේවාල ඇසළ උත්සවය - 2015

362 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති අංක 1563 2008.08.15 වන දිනැති *ගැසට් පත්‍රය* ප්‍රකාරව හා 1992 අංක 58 දරන බලතල පැවරීම (ප්‍රාදේශීය ලෙකම්වරුන්) පනත අනුව රත්නපුර ප්‍රාදේශීය ලේකම් චිත්‍රා මානෙල් කෝට්ටවත්ත වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2015 සබරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පවරමි.

01. මෙවර සබරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය 2015 සැප්තැම්බර් මස 12 වැනි දිනෙන් ආරම්භ වී සැප්තැම්බර් මස 28 වැනි දිනෙන් අවසන් වන බව දනුම් දෙමි.

02. උතුරට වැසියන් පදිංචි පරවේනි නිලකරුවන්ගේ ඉඩම් රථගාල් හා සල්පිල් භූමිය පෙන්වන සිමෙන්ති කණුව හා රථ ගාලට ඇතුළු වන පාරද, දකුණට තෙන්නගේ වත්ත හා කළු ගඟ ද, නැගෙනහිරට රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට දේවාලය සතු මහ උයන් වත්ත ද යන සීමාවන්ට මැදිව පිහිටි භූමිභාගය වේ. රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන වාහල් කඩේ සිට කොටාඹේ දක්වා ගමන් කර එතන සිට මාර්ගය ඔස්සේ කළු ගඟ දක්වා හා කළු ගඟ ඔස්සේ රත්මල් ඇල්ල දක්වා ගමන් කර එම ස්ථානයේ දී දිය කපා ආපසු එම මාර්ගය ඔස්සේ නැවත මහ සමන් දේවාලය දක්වා පැමිණ දිය කැපීමේ පෙරහැරේ ගමන් මාර්ගය වේ.

03. දේවාල භූමිය, වැලිමළුව, හුණු වන වීදිය හා කුරුවිට ගම්පහේ වීදියට මැදිව පිහිටි භූමි භාගය හා වීදිය අවට භූමිය තුළ ආහාර පිසීම තහනම් කරමි.

04. පෙරහැර දින 05 සඳහා සල්පිල් භූමිය පිහිටි ස්ථිර මල් කඩ 06ක්, තාවකාලික වෙළඳ සැල් 06ක් හා සල්පිල් භූමිය තාවකාලික වෙළඳ සැල් 200 සඳහා මා විසින් වෙන්දේසි කර අවසරය ලබා දෙන බව දන්වමි. මෙම වෙළඳ සැල්හි මල් හඳුන්කූරු, ඉටිපන්දම්, කපුරු භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප, රසකැවිලි හා විසිතුරු භාණ්ඩ විකිණීම සඳහා අවසරය දෙමි.

05. අංක 04 සඳහන් සල්පිල් භූමියේ හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම තහනම් කරමි.

06. රථගාල පරිශ්‍රය හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිදු ස්ථානයක පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මගින් හෝ කඳවුරු භාර නිලධාරී තැනගේ අවසර පත්‍රයක් නොමැතිව උත්සව භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

07. රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ප්‍රධාන වාහල් කඩ තුළින් දේවාල පූජා භූමියට වාහන ඇතුළත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස්, වෙන්දේසි කරන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

09. වෙන්දේසි කරන වෙළඳ බිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් ලබා ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

10. රත්නපුර ප්‍රාදේශීය ලේකම් මගින් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි.

*15 වන ව්‍යවස්ථාව*

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්තැනගේ අවසරය ලබා ගෙන මිස විදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර ගන්නාවූ හෝ උත්සව භූමිය තුළ වෙනයම් භූමි කොටසක් හෝ ඇසුරු කරගෙන මඩුවක් හෝ යම් කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ හෝ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

(ඇ) සමන් දේවාල පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාලය සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනය හා සියලු මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

09 - 117

---

**වන්දනා පනත**

2015 වර්ෂයේ පාණ්ඩිරිප්පු ශ්‍රී තුරෝපති අම්මන් කෝවිල් උත්සවය

**අම්පාර දිස්ත්‍රික්කය කල්මුනේ දෙමළ කොටස ප්‍රදේශීය ලේකම් කාර්යාල වසම**

මෙම දේවාලයේ 2015 වර්ෂයේ වාර්ෂික මහෝත්සවය 2015 සැප්තැම්බර් මස 08 වැනි දින ආරම්භව 2015 සැප්තැම්බර් මස 26 වැනි දින නිමාව දැක්වෙන බව සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් බැතුමතුන්ට දන්වනු කැමැත්තෙමි.

1951 මැයි මස 11 වැනි දින අංක 10247 දරන රජයේ ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි මෙම උත්සව සමයේ පිළිපදින ලෙස සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් බැතිමතුන්ට දන්වනු ලැබේ.

උත්සව භූමියේ සිතියම පහත සඳහන් පරිදි වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | පාණ්ඩිරිප්පු පිල්ලෙයාර් කෝවිල පාර, |
| නැගෙනහිරට | : | පාණ්ඩිරිප්පු වෙරල පාර, |
| දකුණට | : | කල්මුනේ පාණ්ඩිරිප්පු මායිම පාර, |
| බස්නාහිරට | : | පෙරියකුලක්කට්ටු පාණ්ඩිරිප්පු |

එස්. කේ. ලවනාතන්,
ප්‍රාදේශීය ලේකම්,
කල්මුනේ (දෙ.කො).

09 - 122

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/42/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.09.11 වැනි දින සිට 2015.09.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමඟ 2015.10.02 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම්, ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ , එම් දරන කොට්ඨාසයේ 3030 වෙළුමේ 08 පත්‍රිකාව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළයේ පැලැන්වත්ත පිහිටි 'දෙල්ගහවත්ත' සහ ඉඳිගහවත්ත සහ රද්දාදෙණිය හෙවත් පොකුණේකුඹුර' නැමති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 18 දරන කැබැල්ලට එස්. වික්‍රමසිංහ බලයලත් මානක විසින් 2006.09.25 දින මැන සාදන ලද අංක 9243 දරන පිඹුර ප්‍රකාර මායිම්,<br><br>*උතුර* : ලොට් 17<br>*නැගෙනහිර* : ලොට් 17<br>*දකුණ* : කේ. ඩී. සේදිරිස්ට අයත් ඉඩම<br>*බස්නාහිර* : ලොට් 01, ඩී 1<br>*ප්‍රමාණය* : අ. 00, රූ. 00, ප. 11 | 01. එල්. ජේ. තාබෲ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2007.03.01 දින ලියා සහතික කරන ලද අංක 3569 දරන විකුණුම්කරය.<br><br>02. එස්. නානායක්කාර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2007.10.18 දින ලියා සහතික කරන ලද අංක 2317 දරන අතිරේක විකුණුම් ගිවිසුම.<br><br>03. එස්. නානායක්කාර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2007.10.31 දින ලියා සහතික කරන ලද අංක 2322 දරන විකුණුම්කරය. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො. 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 150

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/44/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.09.04 වැනි දින සිට 2015.09.18 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමඟ 2015.09.25 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම්, ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ , | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ සියනෑ කෝරළේ 'හුණුපිටියේ පිහිටි හුණුපිටියේ කුරුඳුවත්ත සහ දවටගහවත්ත' නැමැති ඉඩමේ | 01. ඩබ්. එම්. සී. ඒ. නක්කාවිට ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1977.06.07 දින අංක 2783 දරන විකුණුම් ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| සී දරන කොට්ඨාසයේ 410 වෙළුමේ 76 පත්ඉරුව | අංක බී2 දරන කැබැල්ලට ඒ. එෆ්. සමීර් මානක තැන විසින් 1977.04.30 දින මැන සාදන ලද අංක 1907 දරන පිඹුරට ප්‍රකාර මායිම්, | 02. ඩී. එල්. ආර්. පොන්වීර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2002.07.09 දින අංක 1207 දරන විකුණුම් ඔප්පුව. |

උතුර : ලොට් බී 1
නැගෙනහිර : පාර
දකුණ : ලොට් බී 3
බස්නාහිර : එල්. ඩී. එස්. අමරතුංගට සහ තවත් අයට අයිති ඉඩම
ප්‍රමාණය : අ. 00, රූ. 00, ප. 25.60

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක. 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 168

---

**වන්දනා ගමන් ආඥාපනත**

කැන්දවල ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ වාර්ෂික
පෙරහැර මංගල්‍යය - 2015

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැන්දවල ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැර මංගල්‍යය 2015 සැප්තැම්බර් මස 26 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම්. ඒ. එස්. මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

09-246

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**මහජන බැංකුව - මහරගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.05.26 වන දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2007.03.28 දින අංක 1672, නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉදුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2009.07.31 දින අංක : 3866 සහ නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එම්. නාරංගොඩ මහත්මිය විසින් සහතික කරන ලද 2011.06.03 දින අංක : 2319 දරන උකස් බැඳුම්කර මත අය විය යුතු ගෙවීම් කිරීම ගංගොඩවිලගේ නිහාල් දාබරේ මහතා සහ අහංගම ලියන ආරච්චිගේ තෙරේසා මල්ලිකා මහත්මිය විසින් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර මත දැන් රුපියල් හතලිස් නව ලක්ෂ තිස් හත් දහස් දෙසීය හැට හතරයි ශත තුනක (රු.4,937,264.03) මුදලක්ද, රුපියල් පන් ලක්ෂ හැට දහසක (රු.560,000) මුදලක්ද, රුපියල් දස ලක්ෂයක (රු.1,000,000) මුදලක් ද,

රුපියල් දහඅට ලක්ෂයක (රු.1,800,000) මුදලක් ද, මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින්, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරි ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් හතලිස් නව ලක්ෂ තිස් හත් දහස් දෙසීය හැට හතරයි ශත තුනක (රු.4,937,264.03) එකී මුදලද, රුපියල් පන් ලක්ෂ හැට දහසක (රු.560,000) එකී මුදලද රුපියල් දස ලක්ෂයක (රු.1,000,000) එකී මුදල ද රුපියල් දහ අට ලක්ෂයක (රු.1,800,000) එකී මුදලද, 2013.07.09 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හතලිස් නව ලක්ෂ තිස් හත් දහස් දෙසීය හැට හතරයි ශත තුනක (රු.4,937,264.03) මුදලක් මත වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් තව දුරටත් වූ පොළිය ද 2013.07.04 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් පන් ලක්ෂ හැට දහසක (රු.560,000) මුදලක් මත වර්ෂයකට සියයට විසි පහයි දශම පහ (25.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද, 2013.07.03 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දශ ලක්ෂයක (රු.1,000,000) මුදලක් මත වර්ෂයකට සියයට දහසය (16%) බැගින් තව දුරටත් වූ පොළිය ද 2013.07.15 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දහ අට ලක්ෂයක (රු.1,800,000) මුදලක් මත වර්ෂයකට සියයට දහසය (16%) බැගින් තව දුරටත් වූ පොළිය ද විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 1672, 3866 හා 2319 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව ඇතුළත මහරගම ගමේ පිහිටියා වූ ද, ''මාරගහවත්ත'' යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එච්. බී. නිහාල් විසින් සාදන ලද අංක 2108 හා 2006.10.01 දින දරන පිඹුරේ ලොට් අංක ''1බී'' ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : අංක 231 දරන පිඹුරේ අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කර ඇති ලොට් 1 ඩී දරන කොටස ද, නැගෙනහිරට : අංක 231 දරන පිඹුරේ ලොට් 1 සී දරන කොටස ද, දකුණට : එම්. පී. යූ. ප්‍රේමලතාගේ සහ ඒ. එච්. මුණසිංහගේ ඉඩම් ද, බස්නාහිරට : අංක 231 දරන පිඹුරේ ලොට් 1 ඒ දරන කොටස ද, මායිම් වන්නා වූ ද, එකී අංක 2108 දරන පිඹුරට අනුව පර්චස් දහනවයක් (අ. 0, රූ. 0, පර්. 19.0) විශාල වූද, බෙද වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත්ය. නුගේගොඩ/දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී9/35 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මැණීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල් පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ (මහරගම උප නගර සභා සීමාව තුළ) මහරගම ගමේ පිහිටියා වූ ද, ''මාරගහවත්ත'' යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු සී. එච්. ජී. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක : 231 හා 1970.03.21 දින දරන පිඹුරේ ලොට් ''1බී'' ලෙස සලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කිරීම වන ලොට් 1 ඩී දරන කොටස ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 1 සී දරන කොටස ද, දකුණට : එම්. පී. යූ. පද්මලතා සහ ඒ. එච්. මුණසිංහ විසින් හිමිකම් කියන ''ගෆූර් එස්ටේට්'' වත්තේ කොටස ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් අංක : 1ඒ දරන කොටස ද මායිම් වන්නා වූ ද, එකී අංක : 231 දරන පිඹුරට අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20.0) විශාල වූ ද, බෙද වෙන් කරන ලද මුළු ඉඩම් කොටස හා එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ වැවිලි හා වෙනත් සියලු දේත්ය.

එකී අංක 231 දරන පිඹුරේ ලොට් 1 ඩී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස (අඩි 15ක් පළල) උඩින් සහ දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප - II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය(කොළඹ පිටත),
අංක 177/ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

09-114

---

## මහජන බැංකුව - මාදම්පේ ශාඛාව

1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.04.23 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. එස්. රන්සිරිනි ජෝශප් මහත්මිය විසින් 2011.09.28 වැනි දින රු. 6,200,000 සඳහා සහතික කරන ලද අංක 403 දරන උකස්කරයද 2011.09.28 රු. 1,000,000 ක් සඳහා සහතික කරන ලද අංක 405 දරන උකස් කරයද, යන උකස්කරයන් ප්‍රකාර ගෙවීම්,

වර්ණකුලසූරිය කිංස්ලි පෙරේරා, තෙලිකඩ පල්ලිය ගුරුගේ රමණී ඉන්ද්‍රානි අල්විස්, වර්ණකුලසූරිය ඉෂාරා ශ්‍යාමංගි පෙරේරා යන අයවළුන් විසින් එකී උකස්කරයන් යටතේ දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති රුපියල් විසි නව ලක්ෂ හැත්තෑ හත් දහස් හයසිය හැට පහයි ශත විස්සක (රු.2,977,665.20) ක මුදලක් සහ රුපියල් ලක්ෂ දහය (රු.1,000,000) ක මුදලක්, අයවීමට ඇති බැවින්ද, 2015.01.01 වැනි දින සිට වර්ෂයකට 14.5% බැගින් රුපියල් විසි අට ලක්ෂ අනූතුන් දහස් තුන්සිය තිස්තුනයි ශත හතලිස් හතර (2,893,333.44) ක මුදලක් සඳහා පොළියද, 2014.02.01 වැනි දින සිට වර්ෂයකට 15.5% බැගින් රුපියල් ලක්ෂ දහය (රු. 10,00,000)ක මුදල සඳහා පොළියද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් විසි නව ලක්ෂ හැත්තෑ හත් දහස් හයසිය හැට පහයි ශත විස්සක (රු.2,977,665.20) ක මුදලක් සහ රුපියල් ලක්ෂ දහය (රු.1,000,000) ක මුදල හා පොළී අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 403 දරන උකස්කරය සහ අංක 405 දරන උකස්කරයද යන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් කටුගම්පල හත්පත්තුවේ දකුණු කටුගම්පොල කෝරලේ බුත්තැහැපොල නමැති ගමේ පිහිටි ඉහලපිටිය කටුගම්පල එස්ටේට් නමැති ඉඩමට ජේ. ඒ. එස්. ජයලත්, බලයලත් මානක තැන විසින් 2008.05.11 වැනි දින මැන සාදන ලද අංක 15/08 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | මාදම්පේ සිට කුරුණෑගල දක්වා දිවෙන මහා මාර්ගය ද, |
| නැගෙනහිරට | : | එස්. ඒ. සුසිලා විජේසිංහ ට අයිති ඉඩම ද, |
| දකුණට | : | ජේ. එල්. විරවර්ධන බලයලත් මානක තැනගේ 3646 දරන පිඹුරේ ලොට් අංක 04 දරන කොටස ද, |
| බස්නාහිරට | : | ජේ. එල්. වීරවර්ධන බලයලත් මානක තැනගේ 3646 දරන පිඹුරේ ලොට් අංක 08 දරන කොටස ද |

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙක (අක්. 02, රූඩ් 0, පර්. 0) ක් හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම අටයි බිංදුවයි නවයයි හතර (හෙක්. 0.8094) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලුදේත් මේ සමඟ වේ.

මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 236/137 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර - පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

09-115

---

### මහජන බැංකුව - කොටහේන ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.06.26 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. දීප්ති ආර්. මෙන්ඩිස් විසින් සහතික කරන ලද 2009.04.06 වැනි දින අංක 3707 දරන උකස් බැඳුම්කරය මත සහ මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ විසින් සහතික කරන ලද 2011.05.03 දින අංක 4782 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 174/2, පොල්හේන, කැළණිය යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද අංක PV 20466 යටතේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන යසුකෝ ලංකා ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතනය විසින් සහ අංක 174/2, පොල්හේන, කැළණිය යන ලිපිනයේ පදිංචි කොඩිතුවක්කු මුදලිගේ රවීන්ද්‍ර ප්‍රියලාල් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3707 සහ 4782 දරන උකස් බැඳුම්කර මත 2015.03.17 වැනි දිනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන හයයි නවලක්ෂ තිස් නව දහස් විසි දෙකයි ශත විසි දෙකක් (රු.6,939,022.22) වූ මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර (ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව වෙනත් විකුණුම් පිරිවැය සහ ගාස්තු සමඟ 2015.03.18 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් මිලියන දෙකයි හාරලක්ෂ හැත්තෑ පන්දහසක් (රු.2,475,000) වූ මුදලක් මත වර්ෂයකට 26% ක් වූ පොළී මුදලක් ද, 2015.03.18 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් නවලක්ෂ තිස්නව දහස් හත්සිය අසූ හතයි ශත අනූනවයක් (රු.939,787.99) වූ මුදලක් මත වර්ෂයකට 15% වූ පොළී මුදලක් ද, 2015.03.18 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් දෙලක්ෂ පනස් හතර දහස් එකසිය හතළිහයි ශත තිස් හතරක් වූ (රු.254,140.34) මුදලක් මත වර්ෂයකට 15% වූ පොළී මුදලක් ද, සමග රුපියල් මිලියන හයයි නවලක්ෂ තිස්නව දහස් විසිදෙකයි ශත විසි දෙකක් වූ (රු.6,939,022.22) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කර මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ කැළණිය, ඒකකය තුළ කැළණිය පොල්හේන නිවාස යෝජනා ක්‍රමය පාරේ පිහිටා ඇති වරිපනම් අංක 254/3 දරන ''මිල්ලගහවත්ත සහ හිග්ගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1996 අගෝස්තු 21 වැනි දින අංක 2458 දරන පිඹුරේ ''ලොට් A '' ලෙස ලකුණු කර ඇති උතුරට අංක 2439 දරන පිඹුරේ ''ලොට් X'' සහ එස්. ඒ. සිරිසේන සහ තවත් අයගේ ඉඩම ද, නැගෙනහිරට අංක 70/1986 දරන පිඹුරේ 'ලොට් අංක 2'' සහ ''4'' දරන කොටස් සහ අංක 2457 දරන පිඹුරේ 'ලොට් B 1'' දරන කොටස ද, දකුණට රජයේ පටුමග ද බටහිරට එස්. ඒ. සිරිසේන සහ තවත් අයට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි, කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක C 683/224 යටතේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් විසිහතක් වූ (අ.0, රූ. 2, පර්. 27) බෙද වෙන් කළ ''ලොට්A'' දරන ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කළාප කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කළාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කළාපය -01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

09-116

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - වෙන්නප්පුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගණුදෙනුකරුගේ නම : අයි. පී. සී. ඉන්ජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015 ක් වූ ජුනි මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, ඉහත කී අයි. පී. සී. ඉන්ජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් විසින් "බන්ධනදයී/උකස්කරු" ලෙස ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද වර්ෂ 2012 ක් වූ ජූලි මස 05 වන දිනැති අංක 5026 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2013 ක් වූ ජූලි මස 24 වැනි දිනැති අංක 388 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද, ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 5026 සහ 388 දරන උකස්කරයන් මත,

(අ) වර්ෂ 2015 ක් වූ මැයි මස 24 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් පනස් නව ලක්ෂ පන්සිය හතලිස් හයයි ශත අනූ දෙක (රු.5,900,547.92) ක මුදලක් ද, වර්ෂ 2015 ක් වූ මැයි මස 25 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් පනස් ලක්ෂය (රු. 5,000,000) ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 19%ක පොළිය ද, ඉහත කී බන්ධනදයී/උකස්කරුගෙන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබෙන හෙයින් ද,

(ආ) වර්ෂ 2015 ක් වූ මැයි මස 24 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දෙසිය තිස් පන් ලක්ෂ තිස් නව දහස් හයසිය අනූහතයි ශත හැට (රු.23,539,697.60) ක මුදලක් ද, වර්ෂ 2015 ක් වූ මැයි මස 25 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් දෙසිය තිස් දෙලක්ෂ හැට තුන් දහස් හයසිය විසි හතයි ශත අනූව (රු.23,263,627.90) ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 24% ක පොළී ද, ඉහත කී බන්ද්‍රාධනදයී /උකස්කරුවන්ගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත් ;

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු එකී රුපියල් දෙසිය අනූ හතර ලක්ෂ හතලිස් දහස් දෙසිය හතලිස් පහයි ශත පනස් දෙක (රු.29,440,245.52) ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොලිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොලොන්නාවේ, විහාර මාවතේ අංක 182/3(50/3) හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) කොළඹ මහනගර සභා සීමාව තුළ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කොට්ඨාස අංක 23 හි හුණුපිටිය, කොම්පඤ්ඤ වීදියේ පිහිටි වොක්ෂොල් වීදියේ වරිපනම් අංක 273/5 දරන, බලයලත් මිනින්දෝරු පී. ගාල්ලගේ විසින් මැන සාදන ලද 1991.03.02 දිනැති අංක 10/91 දරන පිඹුරෙහි ලොට් A වශයෙන් නිරූපිත (බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් මැන සාදන ලද 1985.01.21 දිනැති අංක 394 (සී. එච්. /0/202/3953) හි ලොට් 1 ලෙස දැක්වෙන සමානාකාර ඉඩමෙහි නැවත මැනීමක් වන) උතුරින් : වොක්ෂෝල් වීදියේ වරිපනම් අංක 273/4 දරන පරිශ්‍රය සහ රජයේ ඉඩම ද, නැගෙනහිරින් : රජයේ ඉඩම ද, දකුණින් : බලයලත් මිනින්දෝරු විල්ප්‍රඩ් දන්තනාරායන විසින් මැන සාදන ලද 1976.04.19 දිනැති පිඹුරු අංක 429 (සී. එච්. /0/3/202/279) හි ලොට් 4 ද, බස්නාහිරින්, බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් මැන සාදන ලද 1985.01.21 දිනැති පිඹුරු අංක 394 (සී. එච්. 0/202/3953) හි ලොට් 2 ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම නවයයි හතර (අ. 0, රූ. 0, පර්. 5.94) ක් විශාලත්වය ඇති දේපළ වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු A1044/104 සහ A1044/262 හි ලියාපදිංචි වී ඇත.

තවද, පහත දැක්වෙන මාර්ග රක්ෂිතය මතින් සහ ඔස්සේ පවතින මාර්ග අයිතිය සහ අනෙකුත් අනුබද්ධ පරවශ අයිතීන්ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) කොළඹ මහනගර සභා සීමාව තුළ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොට්ඨාස අංක 23 හි හුණුපිටිය, කොම්පඤ්ඤ වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. දන්තනාරායන විසින් මැන සාදන ලද 1976.04.19 දිනැති පිඹුරු අංක 429 (සී. එච්. 0/3/202/279) හි නිරූපිත ලොට් 4 නැමැති උතුරු - නැගෙනහිරට : වොක්ෂෝල් වීදිය ද, දකුණු - නැගෙනහිරට ලොට් 6 ද, දකුණු බස්නාහිරට : වොක්ෂෝල් වීදිය සහ ලොට් 1, 2 සහ 3 ද, උතුරු බස්නාහිරට : වෝක්ෂෝල් වීදියේ වරිපනම් අංක 267 දරන පරිශ්‍රය ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම අටයි පහ (අ. 0, රූ. 0, පර්. 4.85) ක් විශාලත්වය ඇති දේපළ වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1163/143 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචිව ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ලියාපදිංචි කොට්ඨාසය තුළ) ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම්පිටිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, ජා ඇල මහ නගර සභා සීමාවට අයත් ඉඳිවිටිය කොට්ඨාස අංක 02 හි වැලිගම්පිටියේ පිහිටි ජා ඇල ලේක්සිටි හෝම්ස් හි 39 වන පටුමගේ, වරිපනම් අංක 435 දරන දැනට ලේක්සිටි යනුවෙන් හැඳින්වෙන පෙර පූවෙල නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සුබාසිරි ලියනගේ විසින් මැන සාදන ලද 2003.06.02 දිනැති අංක 224 දරන පිඹුරේ දැක්වෙන ලොට් 435 දරන (සර්වේ ජනරාල්වරයාගේ 1991.08.20 දිනැති අංක PP. co. 1638 පිඹුරේ දැක්වෙන ලොට් 1, 2, 3 සහ 4 හි කොටස් ඒකා බද්ධ කොට මැන බෙදා වෙන් කළ ඉඩමේ නැවත මැනීමක් වන) උතුරින් : ඇල ද නැගෙනහිරින් :ලොට් 436 ද දකුණින් : R 39 (මීටර් 6 පළල පාර) ද බස්නාහිරන් : ලොට් 434 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අට (අ. 0, රූ, 0, පර්. 8) ක් හෙවත් හෙක්ටයාර් 0.0202 ක් විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු/ 64/244 සහ J75/61 හි ලියාපදිංචිව ඇත.

තවද, එකී පිඹුරු අංක 224 හි දැක්වෙන පහත සඳහන් බිම් කැබලි මතින් සහ ඔස්සේ පවතින මාර්ග අයිතිය සහ අනුබද්ධිත අනෙකුත් පරවශ අයිතීන් සමග වේ.

කැබලි අංක R1, R2, R3, R4, R5, R6, R7, R8, R9, R10, R11, R12, R13, R14, R15, R16, R17, R18, R19, R20, R21, R22, R23, R24, R25, R26, R 27, R28, R29, R30, R31, R32, R33, R34, R35, R36, R37, R38, R39, R40, R41, R42 සහ R43 වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - ණය අයකර ගැනීම්.

09-254

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1635800
මොහොමඩ් ලෆීර් මොහොමඩ් සියාඩ්

2015 ජුනි 26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් 2012 මාර්තු මස 15 වන දින සහතික කරන ලද අංක 1618 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්ද වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ''ලැප්සන් ට්‍රේඩ් සෙන්ටර්'' යන වෙළඳ නාමය යටතේ තනි අයිතිකාර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මොහොමඩ් ලෆීර් මොහොමඩ් සියාඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති මෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි දසලක්ෂ දෙදහස් හයසිය හැත්තෑ දෙකක (රු.11,002,672) මුදලක් 2015 අප්‍රේල් 28 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි දසලක්ෂ දෙදහස් හයසිය හැත්තෑ දෙකක (රු.11,002,672) මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අප්‍රේල් 29 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු.9,685,000 ක මුදල මත 17% ක වැඩිදුර පොලියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 1618 බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල සහ පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 200 දරන ස්ථානයේ 2 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ මැද පත්තුවේ තිහාරියේ පිහිටි දෙල්ගහවත්ත, ඇටඹගහවත්ත, නුගගහලන්ද සහ ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. රූපසිංහ විසින් 2011 නොවැම්බර් 27 වන දින සාදන ලද අංක 194/2011 දරන පිඹුරේ ලොට් 9B1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට මුස්ලිම් පල්ලිය සහ එම්. හම්සා, එම්. නසාර් සහ එම්. රහමන්ට අයිති අංක 2313 දරන පිඹුරේ ලොට් B2 ද ගිණිකොණට ලොට් 9B2 ද නිරිතට අංක 2386 දරන පිඹුරේ ලොට් 8 (අඩි 15ක් පළල වෙන් කරන ලද පාර) ද සහ වයඹට අංක 128/A2011 දරන පිඹුරේ ලොට් 9A වලින් ද මායිම් වූ අංක 194/2011 ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දහය (අ. 0, රූ. 1, පර්. 10)ක විශාලත්වයෙන් වූ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලු දේත් සමග වේ.

ඉහත විස්තර සඳහන් ලොට් 9B1 පහත විස්තර සඳහන් ඉඩමේ නැවත බෙදීමක් වේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්යේ සියනෑ කෝරලේ මැද පත්තුවේ තිහාරියේ පිහිටි දෙල්ගහවත්ත, ඇටඹගහවත්ත, නුගගහලන්ද සහ ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් 1980 ඔක්තෝබර් 05 වන දින සාදන ලද අංක 2386 දරන පිඹුරේ ලොට් 9 වශයෙන් දැක්වෙන (පාරක් සඳහා වෙන් කරන ලද) ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට අංක 2313 දරන පිඹුරේ ලොට් B2 ද ගිණිකොණට ලොට් 10 ද නිරිතට (පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 8 ද සහ වයඹට ලොට් 7 න් ද මායිම් වූ අංක 2386 ප්‍රකාරව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) ක විශාලත්වයෙන් වූ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලු දේත් සමඟ වන මෙය කොළඹ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E 1020/246 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර සඳහන් මාර්ග වෙන් කිරීමේ පරිහරණ අයිතිය සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ මැද පත්තුවේ තිහාරියේ පිහිටි දෙල්ගහවත්ත, ඇටඹගහවත්ත, නුගගහලන්ද සහ ඇටඹගහලන්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් 1980 ඔක්තෝබර් 05 වන දින සාදන ලද අංක 2386 දරන පිඹුරේ ලොට් 8 වශයෙන් දැක්වෙන (පාරක් සඳහා වෙන් කරන ලද) ඉඩම් කොටසට මායිම් වශයෙන් ඊසානට ලොට් 6, 7, 9 සහ 10 ද ගිණිකොණට කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගය ද නිරිතට ලොට් 1, 2, 3 සහ 4 ද සහ වයඹට ලොට් 5න් ද මායිම් වූ අංක 2386 ප්‍රකාරව රූඩ් එකයි පර්චස් පහළොවක (අ. 0, රූ. 1, පර්. 15) ක විශාලත්වයෙන් වන මෙය කොළඹ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E209/266 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ,
සමාගම් ලේකම්.

09-266

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1380089

නිව් බර්නාඩ්ස් ඇනිමල් ෆීඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2015 මාර්තු මස 30 වන දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පී. පීරිස් විසින් 2012 නොවැම්බර් 07 වන දින සහතික කරන ලද අංක 49 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්ද වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකා රජය යටතේ සංස්ථාපිත නීත්‍යානුකූල සමාගමක් වන උඩුබද්දව නැවකඩ පාරේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති නිව් බර්නාඩ්ස් ඇනිමල් ෆීඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ වැල්ලවත්තගේ ලෙස්ලි බර්නාඩ් පෙරේරා උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්කෝටි විසිලක්ෂ විසිනමදහස් අටසිය අසූනමයයි ශත අසූතුන (රු. 52,029,889.83) මුදලක් 2015 ජනවාරි 30 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පන්කෝටි විසිලක්ෂ විසිනමදහස් අටසිය අසූනමයයි ශත අසූතුන (රු.52,029,889.83) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 ජනාවාරි 31 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 44,658,000 මුදල මත 9.33% (PLR+3%) ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 49 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩ්‍රෝෆ් විදියේ 2 වන මහලේ අංක 200 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

#### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දකුණු කටුගම්පොල කෝරලේ කටුගම්පොල හත්පත්තුවේ උඩුබද්දව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුන්නැහැපොල ග්‍රාම නිලධාරී වසමේ බුන්නැහැපොල ගමේ පිහිටි ඉහලපිටිය සහ කටුගම්පොල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් 1998 නොවැම්බර් 08 වන දින සාදන ලද පිඹුරු අංක 3328 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩමට මායම් වශයෙන් උතුරට එස්. ඒ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 100/76 දරන පිඹුරේ ලොට් 2, වශයෙන් දක්වෙන එම ඉඩමේම ඉතිරි කොටස සහ එස්. ඒ. එස්. විජේසිංහ හිමිකම් කියන ලොට් 1 න් ද නැගෙනහිරට ප්‍රාදේශීය සභා පාරෙන් ද දකුණට එස්. ඒ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 100/76 දරන පිඹුරේ ලොට් 5 ඒ, 07 සහ 10 න් ද සහ බස්නාහිරට එම්. ජේ. ගෝමස් විසින් සාදන ලද අංක 3328 දරන පිඹුරේ ලොට් 2 සහ එස්. ඒ. එස්. විජේසිංහ හිමිකම් කියන ඉඩම එස්. ඒ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 100/76 දරන ලොට් 1 න් ද මායිම් වූ එකී අංක 3328 දරන පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි පර්චස් දහසයයි දශම බිංදුවයි පහ (අ. 2, රූ. 0, පර්. 16.05) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියළු දේත් සමඟ වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ යොමු කේ 273/51 යටතේ ලියාපදිංචි වී ඇත.

රංජනී ගමගේ,
සමාගම් ලේකම්.

09-267

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කෑගල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

යුනි ලංකා මාකටින් නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මොහොමඩ් හුසේන් මොහොමඩ් රෆියුඩීන්, මොහොමඩ් ජලීල් මොහොමඩ් ෆවුම් ජලීල්, මොහොමඩ් රෆියුඩීන් ෆාතිමා රිස්ලා යන අය සහ මොහොමඩ් ජලීල්, මොහොමඩ් ෆවුම් ජලීල්.

2015 ජූලි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දවූ ද 2012 අප්‍රේල් 18 වන දින සහතික කළ අංක 3108 සහ 2014 ජුනි 11 වන දින සහතික කළ අංක 3715 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් ජලීල් මොහොමඩ් ෆවුම් ජලීල්, මොහොමඩ් හුසේන් මොහොමඩ් රෆියුඩීන් සහ මොහොමඩ් රෆියුඩීන් ෆාතිමා රිස්ලා යන අය ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 මැයි 31 දිනට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත රුපියල් හැත්තෑහතර ලක්ෂ දාහත්දහස් තුන්සිය විස්සයි ශත පනස්තුනක (රු.7,417,320.53) (ස්ථිර බැංකු අයිරාවක පහසුකම් සඳහා පමණයි) මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද,

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්.එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2012 මාර්තු 06 වන දින සහතික කරන ලද අංක 3069 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් ජලීල් මොහොමඩ් ෆවුම් ජලීල් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 මැයි 31 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත රුපියල් එක්කෝටි විසිඑක්ලක්ෂ අසූදහස් තුන්සිය හතලිස් හතයි ශත හැට හතක (රු.12,180,347.67) (නිවාස ණය පහසුකම් සඳහා පමණයි) මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද,

එකී හිඟ මුදල්වල එකතු වන රුපියල් 19,597,668.20 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 ජුනි 01 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3108, 3069 සහ 3715 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ

වෙන්දේසිකරු ඩී. කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල සුළු නගර සභා සහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 2 ඉල්ලවතුර හි පිහිටි ඉල්ලවතුර පාරේ වරිපනම් අංක 30 සහ 32, දරන ''හිටිනගෙදරවත්ත හෙවත් උඩහගෙදරවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. අබේරත්න විසින් 1992 අප්‍රේල් 11 වන දින සාදන ලද අංක 586/1 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : සිමෙන් කාණුවකින් වෙන් කරන ලද ඉල්ලවතුර පාර ද, නැගෙනහිරට : අංක 586/1 දරන පිඹුර සඳහා වෙන් කරන ලද ලොට් 2 සහ වරිපනම් අංක 36 දරන පොදු බිත්තියෙන් ද, දකුණට : මහවැලි ගඟ සහ ගඟට යන අඩි පාර ද, උතුරට : ඉල්ලවතුර පාරේ වරිපනම් අංක 26 තම්මැත්තයාගේ වත්තෙන් ද, මායිම් වූ පර්චස් දහනමයක් (අ. 0, රූ. 0, පර්. 19) හෙවත් හෙක්ටයාර් 0.04805 විශාලත්වයෙන් වූ එහි ඇති ගොඩනැගිලි සහ සියලුම දේත් සමග වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-294/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්සී. - ගල්කිස්ස ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතියයි.

ගුරුපරන් සුබ්‍රමනියම්

2015 ජූලි මස 30 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

